# පොලිස් රෝහලේ පුරප්පාඩුව පවතින ඖෂධවේදී කාර්ය මණ්ඩලය සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික ඖෂධවේදීන් බඳවා ගැනීම

01. නාරාහේන්පිට හා කුණ්ඩසාලේ පොලිස් රෝහල්වල පුරප්පාඩුව පවතින ඖෂධවේදී තනතුරු 07 ක් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කර, විශ්‍රාම ලැබූ ඖෂධවේදීන්, පොලිස් නිල තනතුරු රහිතව සිවිල් නිලධරයන් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

02. මෙම තනතුර සඳහා පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලන, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කර විශ්‍රාම ලැබූ ඖෂධවේදීන්ට අයදුම් කළ හැක.

   i. 2021.12.31 දින හෝ ඊට පෙරාතුව වයස අවුරුදු 60 ක් සම්පූර්ණ වූ සහ එදිනට වයස අවුරුදු 63 ට අඩු අවම වශයෙන් වසරක කාලයක් සේවය කිරීමට හැකියාව ඇති අයෙකු වීම.

   ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ඖෂධවේදියෙකු ලෙස (අභ්‍යන්තර හෝ බාහිර) ලියාපදිංචි වී තිබීම.

   iii. විනය හේතුන් නොමැතිව සාමාන්‍ය පරිදි විශ්‍රාම ගත්වා ඇති අයෙකු වීම.

   iv. වෛද්‍ය නිර්දේශයකින් තවදුරටත් සේවය කළ හැකි බවට තහවුරු කර තිබීම.

   v. දිවා / රාත්‍රී සේවය කිරීමට හැකියාවක් තිබීම.

   vi. දිවයිනේ ඕනෑම ස්ථානයක රාජකාරී කිරීමට හැකියාව තිබීම.

03. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගන්නා අතර, ඔවුන් අදාළ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ.

04. නැවත සේවයේ යොදවා ගන්නා නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 අනුව දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

05. නියමිත අයදුම්පත සමග අදාළ විශ්‍රාමික නිලධාරියා තවදුරටත් සේවයේ යෙදීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයකින් යුතු බවට වෛද්‍ය වාර්තාවක් සෞඛ්‍ය 307 ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතුය.

06. ඊට අමතරව, අදාළ නිලධාරියාගේ අයදුම්පත්‍රය සමග පහත ලිපි ලේඛන ද ඉදිරිපත් කළ යුතුයි.

   i. නිලධාරියා විශ්‍රාම ගත්වා ඇති ලිපියේ සහතික කළ පිටපත

   ii. ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත

   iii. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත

07. අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2022.04.01 දිනට පෙර යොමු කළ යුතුයි. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පොලිස් රෝහලේ ඖෂධවේදී තනතුර සඳහා විශ්‍රාමික ඖෂධවේදීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කරන්න.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**

**අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන),**
**අංක 78, දෙවන මහළ,**
**මුක්තාර් ප්ලාසා ගොඩනැගිල්ල,**
**ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.**

**සී.ඩී. වික්‍රමරත්න**
**පොලිස්පති.**

## පොලිස් රෝහලේ සේවය සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික ඖෂධවේදීන් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය

01. සම්පූර්ණ නම - ..................................................
02. මුලකුරු සමග නම - ..................................................
03. ස්ත්‍රී / පුරුෂ භාවය - ..................................................
04. උපන් දිනය - ..................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය - ..................................................
06. ආගම - ..................................................
07. පෞද්ගලික ලිපිනය - ..................................................
08. අධ්‍යාපන සුදුසුකම් - ..................................................
..................................................................................................
..................................................................................................

09. විශ්‍රාම ලැබීමට ආසන්න වසර 05 තුළ රාජ්‍ය සේවයේ දැරූ තනතුරු

| ආයතනය | තනතුර | සේවාව / පන්තිය / ශ්‍රේණිය සමග | කාලපරිච්ඡේදය (සිට / දක්වා) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. රාජ්‍ය සේවයේ අවසාන වසර 05 තුළ විනය ක්‍රියාමාර්ගයකට ලක්වී ඇති / නැති බව -
..................................................................................................

11. විනය ක්‍රියාමාර්ගයකට ලක්වී ඇත්නම් විස්තර - ..................................................
..................................................................................................

(මේ පිළිබඳව ආයතන ප්‍රධානියා සෑහීමකට පත්විය යුතුය)

12. විශ්‍රාම ගැන්වූ දිනය - ..................................................

13. විශ්‍රාම ලැබූ ආකාරය - (අදාළ නොවන කොටස කපා හරින්න)

   i. අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට ළගාවීම

   ii. වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයසට ළගාවීම

   iii. ස්වෙච්ඡා විශ්‍රාම ගැනීමේ වයසට ළගාවීම

   iv. විනය හේතු මත

   v. වෙනත් (හේතු දක්වන්න)

14. විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවනු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර -

| ආයතනය | තනතුර | සේවාව / පන්තිය / ශ්‍රේණිය සමග | කාලපරිච්ඡේදය (සිට / දක්වා) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීම සහ විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : ..........................................

..........................................
අයදුම්කරුගේ අත්සන